Sinhalese | සිංහල

# 2027 වසර සඳහා ප්‍රාථමික පාසලට ඇතුළත් කරගැනීම



Foundation (Prep ලෙස ද හැඳින්වේ) යනු වික්ටෝරියාවේ ප්‍රාථමික පාසලේ පළමු වසරයි.

2027 අප්‍රේල් 30 වැනි දිනට පෙර ඔබේ දරුවාගේ වයස අවුරුදු 5 ක් වන්නේ නම්, ඔවුන්ට පාසල් යාම ආරම්භ කළ හැකිය.
ඔබේ දරුවාට වයස අවුරුදු 6 ක් වූ පසු පාසල් යාම අනිවාර්ය වේ.

## මට අයදුම් කළ හැක්කේ කවදාද?

2027 වසර සඳහා වික්ටෝරියානු රජයේ ප්‍රාථමික පාසලකට ඇතුළත් වීමට අයදුම්පත්:

- **2026 අප්‍රේල් 20 සඳුදා සිට** විවෘත වේ.
- **2026 ජූලි 31 සිකුරාදා වන විට** ඉදිරිපත් කළ යුතුය.

## මගේ දරුවාගේ ඇතුළත් වීමේ අයිතිවාසිකම් මොනවාද?

වික්ටෝරියාව තුළ, *Education and Training Reform Act (2006 අධ්‍යාපන සහ පුහුණු ප්‍රතිසංස්කරණ පනත)* යටතේ ඔබේ දරුවාට නියම කරන ලද අසල්වැසි පාසලට (ඔබේ 'ප්‍රාදේශීය පාසල') යාමට ඔවුන්ට අයිතියක් ඇත. ඔබේ ස්ථිර නේවාසික ලිපිනයට අදාළ පාසල් කලාපය අනුව ඔබේ ප්‍රාදේශීය පාසල තීරණය වේ. ඇතුළත් කිරීම සම්බන්ධ තීරණයන් ගන්නා ආකාරය පිළිබඳ වැඩිදුර දැන ගැනීමට, පාසලට ඇතුළත් කිරීම වෙත පිවිසෙන්න.

## මගේ දරුවාගේ ප්‍රාථමික පාසලේ පළමු වසර සඳහා ඔවුන් ඇතුළත් කළ යුත්තේ කෙසේද?

ඔබේ දරුවා ඔවුන්ගේ ප්‍රාථමික පාසලේ පළමු වසරට ඇතුළත් කරන ආකාරය මෙසේය:

1. **ඔබේ ප්‍රාදේශීය පාසල සොයා ගන්න**
   ඔබේ ප්‍රදේශයේ රජයේ ප්‍රාථමික පාසල හෝ අවට පාසල් සොයා ගැනීමට www.findmyschool.vic.gov .au වෙත පිවිසෙන්න.

2. **පාසල සමග සම්බන්ධ වන්න**
   මනාප චාරිකාවක් වෙන්කරවා ගැනීමට ප්‍රාථමික පාසල අමතන්න. පාසල ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය සිදු කරන්නේ මාර්ගගතව ද (VicStudents) නැතහොත් කඩදාසි භාවිතයෙන් ද යන්න තහවුරු කර ගන්න. මෙම තොරතුරු පාසලේ වෙබ් අඩවිය හරහා ලබා ගැනීමට හැකිවනු ඇත.

3. **තොරතුරු පැකේජයක් බාගත කරගන්න**
   Foundation (Prep) වැඩසටහනට ඇතුළත් කරගැනීමේ තොරතුරු පැකේජය Enrolling in Foundation (Prep) වෙතින් බාගත කරගන්න. මෙම පැකේජය 2026 වසරේ අප්‍රේල් 2 වැනි බ්‍රහස්පතින්දා වන විට ලබා ගැනීමට හැකිවනු ඇත.

4. **ඔබගේ ඇතුළත් වීමේ අයදුම්පත ඉදිරිපත් කිරීම**
   ඇතුළත් කිරීමේ අයදුම්පතක් **2026 ජූලි 31 වැනි සිකුරාදා වන විට** පාසල් වෙබ් අඩවියේ විස්තර කර ඇති පාසලේ ක්‍රියාවලිය මත පදනම්ව මාර්ගගතව (VicStudents) හෝ කඩදාසි පෝරමය භාවිතායෙන් ඉදිරිපත් කරන්න.

5. **ප්‍රතිඵලයක් ලබා ගන්න**
   ඔබගේ ඇතුළත් වීමේ අයදුම්පතේ ප්‍රතිඵලය **අගෝස්තු 3 වැනි සඳුදා සහ 2026 අගෝස්තු 14 වැනි සිකුරාදා අතර** ඔබට දැනුම් දෙනු ලැබේ. ඔබට ඇතුළත් කිරීම සඳහා පිරිනැමීමක් ලැබුනහොත්, ඔබ එම පිරිනැමීම **2026 අගෝස්තු 28 වැනි සිකුරාදා වන විට** පිළිගත යුතුය.

6. **පාසලට අනුගත වීම සඳහා ඔබේ දරුවා සූදානම් කරන්න**
   2026 වසරේ 4 වැනි වාරය අතරතුර ශිෂ්‍ය අනුගත සැසිවලට සහභාගී වන්න. ඔබේ දරුවා **2027 ජනවාරි 28 වැනි බ්‍රහස්පතින්දා** සිට Foundation වැඩසටහන ආරම්භ කරනු ඇත.

## මා මගේ ප්‍රාදේශීය පාසල සොයා ගන්නේ කෙසේද?
පහත දක්වා ඇති පියවරයන් අනුගමනය කරමින් Find my School වෙබ් අඩවිය වෙතින් ඔබේ ප්‍රාදේශීය පාසල සොයා ගන්න:

1. ඔබේ බ්‍රවුසරයට www.findmyschool.vic.gov.au ඇතුළත් කරන්න
2. 'Enter your address to get started' (ආරම්භ කිරීමට ඔබේ ලිපිනය ඇතුළත් කරන්න) යටතේ ඔබේ ස්ථිර පදිංචි ලිපිනය ඇතුළත් කරන්න.
3. 'Enrolment year' (ඇතුළත් කරගැනීමේ වසර) යටතේ 2027 තෝරා ගන්න. **2027 වසර සඳහා පාසල් කලාප 2026 අප්‍රේල් 2 වන බ්‍රහස්පතින්දා වන විට** ලබා ගත හැකිය.
4. 'School type' (පාසල් වර්ගය) යටතේ ප්‍රාථමික පාසල තෝරා ගන්න.

එවිට සිතියම මගින් ඔබේ ලිපිනය, ඔබේ ප්‍රාදේශීය පාසල සහ එහි වම් පසින් පාසලේ සම්බන්ධතා තොරතුරු පෙන්වනු ඇත. ඔබ පහළට ගොස් බැලුවහොත්, එහි ඔබගේ ලිපිනයට ආසන්නතම පාසල් පහක් පෙන්නුම් කරයි. 'Search for school' (පාසල සොයන්න) යටතේ ඔබට පාසල්වල නම අනුව ද සෙවිය හැකිය.

## මගේ ඇතුළත් කිරීමේ අයදුම්පත අසාර්ථක වුවහොත් කුමක් කළ යුතුද?
ඔබගේ අයදුම්පත සාර්ථක නොවුවහොත්, ඔබට:

- වෙනත් පාසලකට **අයදුම් කළ හැකිය**. ඔබේ දරුවාට ඔවුන්ගේ ප්‍රාදේශීය පාසලේ ස්ථානයක් ලැබෙන බව සහතික කරනු ලැබේ. ඔබේ දරුවාගේ ප්‍රාදේශීය පාසල සොයා ගැනීමට **Find my School** වෙත පිවිසෙන්න.
- තීරණය සම්බන්ධව අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. ඇතුළත් කරගැනීමේ අයදුම්පත් සම්බන්ධ ප්‍රතිඵලයක් අභියාචනා කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු Enrolling in Foundation (Prep) පිටුවේ ඇත.

## ඇතුළත් කරගැනීමේ කාල රාමු මට මඟහැරුනහොත් කුමක් සිදුවේද?
2027 පාසල් වර්ෂය සඳහා ඔබේ දරුවා Foundation වැඩසටහනට ඇතුළත් කර ගැනීමට **2026 අප්‍රේල් 20 වැනි සඳුදා** සිට ඕනෑම අවස්ථාවක දී ඔබට අයදුම් කළ හැකිය.

**2026 ජූලි 31 වැනි සිකුරාදා වන විට** ඇතුළත් කිරීමේ අයදුම්පතක් ඉදිරිපත් කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටින අතර, ඇතුළත් කිරීමේ කාල රාමුව මග හැරුණු, ස්ථිර පදිංචිය වෙනත් තැනකට වෙනස් කළ හෝ වික්ටෝරියාවට අලුතින් පැමිණි පවුල්වලින් ප්‍රමාද වූ අයදුම්පත් තවදුරටත් භාරගනු ලැබේ.

**2026 ජූලි 31 දිනට පසු ඉදිරිපත් කරන ලද** ඇතුළත් කිරීමේ අයදුම්පත් ප්‍රාථමික පාසල විසින් **එම අයදුම්පත් ලැබෙන ආකාරය අනුව**, දෙපාර්තමේන්තුවේ ඇතුළත් කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව කළමනාකරණය කරනු ලැබේ.

## ප්‍රාථමික පාසලට ඇතුළත් කරගැනීම පිළිබඳ වැඩිදුර තොරතුරු මට සොයාගත හැක්කේ කොතැනින්ද?
පදනම් වැඩසටහනට ඇතුළත් කරගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ වැඩිදුර තොරතුරු ඔබට ඔබේ ප්‍රාදේශීය ප්‍රාථමික පාසලෙන් ඉල්ලා සිටිය හැකිය.

**2026 අප්‍රේල් 20 වන සඳුදා** සිට ඔබට Foundation වැඩසටහනට ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු පැකේජයක් Enrolling in Foundation (Prep) පිටුවෙන් සොයාගත හැකිය.

ඔබට තොරතුරු පැකේජය පරිවර්තනය කරගැනීමට උදවු අවශ්‍ය නම්, කරුණාකර සහාය සඳහා ඔබේ ප්‍රාදේශීය ප්‍රාථමික පාසලට කතා කරන්න.

## උදව් ලබාගැනීම සඳහා මා සම්බන්ධ කර ගත යුත්තේ කවුරුන් ද?
ඇතුළත් කරගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ ඔබට ඇති ප්‍රශ්න සම්බන්ධව ඔබට අයදුම් කිරීමට අවශ්‍ය ප්‍රාථමික පාසලේ සංක්‍රාන්ති සම්බන්ධීකාරකයාට, ඇතුළත් කරගැනීමේ නිලධාරියාට හෝ විදුහල්පතිවරයාට ඔබ වෙනුවෙන් සහාය ලබාදිය හැකිය.

## ප්‍රයෝජනවත් සබැඳි
ඔබේ දරුවා ප්‍රාථමික පාසල ආරම්භ කරන විට ඔබට උපකාරී විය හැකි ප්‍රයෝජනවත් සබැඳි කිහිපයක් පහතින් සොයා ගන්න:

මගේ පාසල සොයන්න - findmyschool.vic.gov.au

පාසල් කලාප පිළිබඳ තොරතුරු - vic.gov.au/school-zones

පදනම් (සූදානම්) වැඩසටහනට ඇතුළත් කරගැනීම - vic.gov.au/enrolling-foundation-prep

පාසලට ඇතුළත් කරගැනීම -vic.gov.au/how-choose-school-and-enrol

අබාධිතතා සහ අන්තර්ගත අධ්‍යාපනය පිළිබඳව - vic.gov.au/disability-and-inclusive-education

ප්‍රාදේශීය කාර්යාල සම්බන්ධතා - vic.gov.au/office-locations-department-education

# 2027 වසරේ Foundation (Prep) වැඩසටහනට ඇතුළත් කිරීම් සඳහා කාලරේඛාව

| 2026 වසරේ දින | දෙමාපියන්/රැකබලා ගන්නන් විසින් කළ යුත්තේ කුමක්ද? |
| --- | --- |
| **1 වැනි වාරය** | **ජනවාරි 27 වැනි අඟහරුවාදා (ශිෂ්‍යයෝ ජනවාරි 28 වැනි දින ආරම්භ කරති) සිට 2026 අප්‍රේල් 2 වැනි බ්‍රහස්පතින්දා දක්වා** |
| **2026 1 වැනි සහ 2 වැනි වාර** | • ප්‍රාථමික පාසල් විසින් සංවිධානය කරන ලද **පාසල් චාරිකා වලට සහභාගී වන්න** *(මනාප පරිදි).* |
| **2026 අප්‍රේල් 2 වැනි බ්‍රහස්පතින්දා වන විට** | • 2027 පාසල් වර්ෂය සඳහා පාසල් කලාප ලබාගත හැකිය. ඔබට **ඔබේ ප්‍රාදේශීය පාසල [www.findmyschoolvic.gov.au](http://www.findmyschoolvic.gov.au)** වෙතින් සොයා ගත හැකිය. |
| **2 වැනි වාරය** | **2026 අප්‍රේල් 20 වැනි සඳුදා සිට ජූනි 26 වැනි සිකුරාදා දක්වා** |
| **2026 අප්‍රේල් 20 වැනි සඳුදා සිට** | • 2 වැනි වාරයේ ආරම්භයේ සිට, **ඔබේ දරුවාගේ අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කරන්න** - ඔබේ පාසලේ උපදෙස් අනුව, මෙය මාර්ගගතව හෝ ඇතුළත් කිරීමේ තොරතුරු පැකේජයේ ඇති අයදුම්පත්‍රය භාවිතයෙන් සිදු කරන්න.<br>• ඔබට **ඇතුළත් කිරීමේ තොරතුරු පැකේජය** Enrolling in Foundation (Prep) **වෙතින් බාගතකර ගැනීමෙන්** වැඩි විස්තර **ලබාගත හැකිය.** |
| **3 වැනි වාරය** | **2026 ජූලි 13 වැනි සඳුදා සිට 2026 සැප්තැම්බර් 18 වැනි සිකුරාදා දක්වා** |
| **ජූලි 31 වැනි සිකුරාදා වන විට** | • **ඔබගේ සම්පූර්ණ කරන ලද අයදුම්පත** මෙම දිනය වන විට ප්‍රාථමික පාසලට ඉදිරිපත් කරන්න. |
| **2026 අගෝස්තු 3 වැනි සඳුදා සහ 2026 අගෝස්තු 14 වැනි සිකුරාදා අතර** | • මෙම කාල සීමාව අතරතුර **ප්‍රාථමික පාසල් විසින් ඔබට ඇතුළත් වීමේ ප්‍රතිඵල ලිඛිතව දැනුම් දෙනු ඇත.**<br>• ඔබගේ අයදුම්පත සාර්ථක නොවුවහොත්, ඔබට ප්‍රාථමික පාසල වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. |
| **2026 අගෝස්තු 28 වැනි සිකුරාදා වන විට** | • ඇතුළත් කිරීමේ පිරිනැමුම සමඟ සපයා ඇති ඇතුළත් කිරීමේ පෝරමය පුරවා **ඔබේ දරුවාගේ ස්ථානය පිළිගන්නා බව තහවුරු කරන්න**.<br>• අභියාචනා කිරීමට ඔබ අදහස් කරන්නේ නම්, අගෝස්තු 28 වැනි සිකුරාදා වන විට ඔබේ ප්‍රාථමික පාසල වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කරන්න. |
| **2026 සැප්තැම්බර් 11 වැනි සිකුරාදා වන විට** | • අභියාචනයේ ප්‍රතිඵල ප්‍රාථමික පාසල් විසින් ලිඛිතව ඔබට දැනුම් දෙනු ඇත. |
| **2026 සැප්තැම්බර් 18 වැනි සිකුරාදා වන විට** | • ඔබ ඔබේ ප්‍රාථමික පාසලට අසාර්ථක ලෙස අභියාචනා කර ඇත්නම්, ඔබට අදාළ ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයා වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. |
| **4 වැනි වාරය** | **2026 ඔක්තෝබර් 5 වැනි සඳුදා සිට දෙසැම්බර් 18 වැනි සිකුරාදා දක්වා** |
| **2026 වසරේ 4 වැනි වාරය** | • ප්‍රථමික පාසල් විසින් පවත්වනු ලබන අනුගත සැසිවලට සහභාගී වන්න. |
| **2026 නොවැම්බර් 6 වැනි සිකුරාදා වන විට** | • ඔබ ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම්, මෙම දිනය වන විට ප්‍රදේශය මගින් ඔබට ප්‍රතිඵලය ලිඛිතව දැනුම් දෙනු ඇත. මෙය අදාළ වන්නේ අවසන් දිනය වන සැප්තැම්බර් 18 වැනි සිකුරාදා විට ලැබී ඇති අභියාචනා සඳහා පමණි. |